මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2024 පෙබරවාරි 29 |

# විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2024 ජනවාරි

## සුවිශේෂී කරුණු

- 2024 වසරේ ජනවාරි මාසයේ දී, වෙළඳ ගිණුමේ හිඟය ප්‍රධාන වශයෙන් ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් පුළුල් විය.
- සේවා වෙළඳාම සම්බන්ධයෙන් ගත් කළ, 2023 වසරේ ජනවාරි මාසයට සාපේක්ෂව, 2024 වසරේ ජනවාරි මාසයේ දී මුහුදු ප්‍රවාහන, ගුවන් ප්‍රවාහන සහ තොරතුරු තාක්ෂණය හා ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන සේවාවන් සඳහා කැපී පෙනෙන ලැබීම් නිරීක්ෂණය විය. මේ අතර, ගෙවීම් වශයෙන් මුහුදු ප්‍රවාහන, ගුවන් ප්‍රවාහන සහ වෘත්තීය සහ කළමනාකරණ උපදේශන සේවාවන් වාර්තා විය.
- විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2024 වසරේ ජනවාරි මාසයේ දී පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ යෑමක් වාර්තා කර ඇත.
- 2024 වසරේ ජනවාරි මාසයේ දී සංචාරක ඉපැයීම් 2020 වසරේ ජනවාරි මාසයෙන් පසුව වාර්තා වූ ඉහළම මාසික අගය වාර්තා කර ඇත.
- 2024 වසරේ ජනවාරි මාසයේ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශ ආයෝජන ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය.
- 2024 වසරේ ජනවාරි මස අවසානය වන විට දළ නිල සංචිත එ. ජ. ඩොලර් බිලියන 4.5ක් දක්වා අඛණ්ඩව වර්ධනය වූ අතර 2024 වසරේ පෙබරවාරි මස 29 දක්වා කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා රුපියල සියයට 4.4කින් අතිප්‍රමාණය විය.

## භාණ්ඩ වෙළඳාමේ ක්‍රියාකාරිත්වය










## සංචාරක ඉපැයීම්




## සේවා අංශය
(සංචාරක ඉපැයීම් හැර)




## විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ




## දළ නිල සංචිත*

2023 ජන. අවසානයට එ.ජ.ඩො. බිලියන 2.1

2024 ජන. අවසානයට එ.ජ.ඩො. බිලියන 4.5

* චීන මහජන බැංකුවෙන් ලද විදේශ විනිමය හුවමාරු පහසුකම මෙයට ඇතුළත් වේ.

## රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත ශුද්ධ ලැබීම් සහ කොළඹ කොටස් වෙළඳපොළ වෙත ශුද්ධ ලැබීම් (ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ - ශුද්ධ)




## විනිමය අනුපාතිකයේ වෙනස්වීම් (එ.ජ. ඩොලරයට රුපියල්)



## වෙළඳ භාණ්ඩ ගිණුමේ ශේෂය

වෙළඳ භාණ්ඩ ගිණුමේ හිඟය, ප්‍රධාන වශයෙන් ආනයනයන්හි ඉහළ වර්ධනයත් සමග 2023 වසරේ ජනවාරි මාසයේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 445ක සිට 2024 වසරේ ජනවාරි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 541ක් දක්වා පුළුල් විය. මීට අමතරව, 2024 වසරේ ජනවාරි මාසයේ වෙළඳ හිඟය, 2023 වසරේ දෙසැම්බර් මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 487ක වෙළඳ හිඟයට සාපේක්ෂව ද පුළුල් විය.

**රූප සටහන 1: අපනයන සංයුතිය**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2: ආනයන සංයුතිය**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය[1]

**වෙළඳ භාණ්ඩ අපනයන ආදායම 2023 වසරේ ජනවාරි මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 978ට සාපේක්ෂව 2024 වසරේ ජනවාරි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 971ක් දක්වා සියයට 0.8ක සුළු පහළ යෑමක් වාර්තා කළේය.** 2024 වසරේ ජනවාරි මාසයේ දී කෘෂිකාර්මික අපනයන වර්ධනය වූ අතර, කාර්මික අපනයන සහ ඛනිජ අපනයන ආදායම්වල පහළ යෑමක් දක්නට ලැබුණි. 2023 වසරේ ජනවාරි මාසයට සාපේක්ෂව 2024 වසරේ ජනවාරි මාසයේ දී **කාර්මික අපනයනවල** පහළ යෑම සඳහා ඇඟලුම් අපනයන ප්‍රධාන වශයෙන් දායක වූ අතර, ඒ සඳහා බොහෝ ප්‍රධාන වෙළඳපොළ වෙත සිදුකළ ඇඟලුම් අපනයනය අඩුවීම හේතු විය. කෙසේ වෙතත්, ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ ගිය අතර, ඒ සඳහා නැව් හා ගුවන්යානා සඳහා භාවිත කරනු ලබන ඉන්ධනවල අපනයන පරිමා ඉහළ යෑම හේතු විය. 2024 වසරේ ජනවාරි මාසයේ දී **කෘෂිකාර්මික අපනයන** ආදායම වසරකට පෙර පැවති අගයට සාපේක්ෂව ඉහළ ගිය අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත, පොල් ආශ්‍රිත නිෂ්පාදිත සහ තේ හේතු විය. මේ අතර, **ඛනිජමය අපනයන** ආදායම පහළ යෑම සඳහා 2023 වසරේ ජනවාරි මාසයේ දී සර්කෝනියම් ලෝපස් විශාල වශයෙන් අපනයනය කිරීමේ පදනම් බලපෑම හේතු විය.

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය[1]

**වෙළඳ භාණ්ඩ ආනයන වියදම, 2023 වසරේ ජනවාරි මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,423ට සාපේක්ෂව 2024 වසරේ ජනවාරි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 1,512ක් දක්වා සියයට 6.2කින් ඉහළ ගියේය.** ආනයන සීමා ලිහිල් කිරීම ද යම් දුරකට බලපෑම හේතුවෙන් පාරිභෝගික භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයන වියදම් ඉහළ යෑම, ආනයන වියදම ඉහළ යෑමට දායක විය. වසරකට පෙර පැවති අගයට සාපේක්ෂව 2024 වසරේ ජනවාරි මාසයේ දී **පාරිභෝගික භාණ්ඩ**

---

[1] වෙළඳ භාණ්ඩ සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකු වර්ගීකරණය සහ සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයේ සිව්වන සංස්කරණය පදනම් කර ගත් සංයුතීන්, පිළිවෙළින්, ඇමුණුම II, ඇමුණුම III, ඇමුණුම IV සහ ඇමුණුම V හි දක්වා ඇත.

ආනයනය සඳහා වූ වියදම ඉහළ ගිය අතර, ඒ සඳහා ආහාර සහ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ යන දෙඅංශයෙහිම ආනයන වියදම්හි පුළුල් වශයෙන් වූ ඉහළ යෑම හේතු විය. මේ අතර, ජල විදුලි උත්පාදනය ඉහළ යෑම ද යම් දුරකට බලපෑම හේතුවෙන් ඉන්ධන ආනයනය පහත වැටීම, **අන්තර් භාණ්ඩ ආනයන** වියදම් අඩුවීම සඳහා හේතු විය. මීට ප්‍රතිවිරුද්ධ ලෙස, මූල ලෝහ සඳහා වන වියදම කැපී පෙනෙන ලෙස ඉහළ ගිය අතර, රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන සඳහා වන වියදම ද ඉහළ ගියේය. යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන ඉහළ යෑම හේතුවෙන් **ආයෝජන භාණ්ඩ** ආනයන වියදම ඉහළ ගිය අතර, යකඩ හා වානේ ආනයන ඉහළ යෑම හේතුවෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම් ද ඉහළ ගියේය.

## වෙළඳ දර්ශක[2]

අපනයන සහ ආනයන මිල ගණන් අතර අනුපාතය දැක්වෙන **වෙළඳ මිල අනුපාතය**, ආනයන මිල ගණන් පහළ යෑමේ වේගයට වඩා වැඩි වේගයකින් අපනයන මිල ගණන් පහළ යෑම හේතුවෙන් 2023 වසරේ ජනවාරි මාසයට සාපේක්ෂව 2024 වසරේ ජනවාරි මාසයේ දී සියයට 3.6කින් පහළ ගියේය.

අපනයන පරිමා දර්ශකය සියයට 4.4කින් ඉහළ ගිය අතර, 2024 වසරේ ජනවාරි මාසයේ දී අපනයන ආදායම සුළු වශයෙන් අඩුවීම සඳහා අපනයන මිල ගණන් පහළ යෑම හේතු වූ බව පිළිබිඹු කරමින් අපනයන ඒකක මිල දර්ශකය සියයට 4.9කින් පහත වැටුණි.

ඒ අතර, 2024 වසරේ ජනවාරි මාසයේ දී ආනයන වියදම වැඩිවීම සඳහා ආනයන පරිමාව ඉහළ යෑම හේතු වූ බව පිළිබිඹු කරමින් ආනයන පරිමා දර්ශකය සියයට 7.7කින් ඉහළ ගිය අතර, ආනයන ඒකක මිල දර්ශකය සියයට 1.4කින් පහත වැටුණි.

**රූප සටහන 3: වෙළඳ මිල අනුපාතය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 4: අපනයන පරිමා සහ ඒකක මිල දර්ශක**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 5: ආනයන පරිමා සහ ඒකක මිල දර්ශක**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

[2] එ.ජ. ඩොලර් වටිනාකම අනුව

## සේවා අංශයේ ක්‍රියාකාරීත්වය[3]

**සංචාරක ඉපැයීම්:** 2024 වසරේ ජනවාරි මාසයේ දී සංචාරක ඉපැයීම්, පෙර මාසයේ දී ඇස්තමේන්තුගත වූ එ.ජ. ඩොලර් මිලියන 269 සහ 2023 වසරේ ජනවාරි මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 154ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 342ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත.

**රූප සටහන 6: මාසික සංචාරක ඉපැයීම්**




මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 7: මාසික සංචාරක පැමිණීම්**




මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**සේවා අංශයේ අනෙකුත් ලැබීම්[4]:** 2024 වසරේ ජනවාරි මාසයේ දී සේවා අංශය වෙත වූ ලැබීම් සඳහා මුහුදු ප්‍රවාහන, ගුවන් ප්‍රවාහන සහ තොරතුරු තාක්ෂණය හා ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන සේවාවන් ප්‍රධාන වශයෙන් දායක විය. 2024 වසරේ ජනවාරි මාසයේ දී සේවා අංශය වෙත වූ මුළු ලැබීම් (සංචාරක ඉපැයීම් හැර) 2023 වසරේ ජනවාරි මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 259ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 248ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත.

**රූප සටහන 8: සේවා අංශය වෙත වූ ප්‍රධාන ලැබීම්**




මූලය: අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය - ශ්‍රී ලංකා මහ බැංකුව

[3] 2024 වසරේ ජනවාරි මාසයේ සිට අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය (ITRS) මත පදනම් වූ උප කාණ්ඩවල දත්ත ද ඇතුලත් වන පරිදි සේවා අංශයේ සංඛ්‍යාලේඛන මාසිකව වාර්තා කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකියාව ඇත.

[4] තාවකාලික

**සේවා අංශයේ ගෙවීම්[4] :** 2024 වසරේ ජනවාරි මාසයේ දී සේවා අංශය වෙතින් වූ ගෙවීම් සඳහා මුහුදු ප්‍රවාහන, ගුවන් ප්‍රවාහන සහ වෘත්තීය සහ කළමනාකරණ උපදේශන සේවාවන් ප්‍රධාන වශයෙන් දායක විය. 2024 වසරේ ජනවාරි මාසයේ දී සේවා අංශය වෙතින් වූ මුළු ගෙවීම් 2023 වසරේ ජනවාරි මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 148ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 183ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත.

**රූප සටහන 9: සේවා අංශයේ ප්‍රධාන ගෙවීම්**




මූලය: අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය - ශ්‍රී ලංකා මහ බැංකුව

## විදේශීය ජංගම ගිණුමේ වාර්තා වූ අනෙකුත් ප්‍රධාන වර්ධනයන්

**විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ:** විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, 2023 වසරේ දෙසැම්බර් මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 570ට සහ 2023 වසරේ ජනවාරි මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 437ට සාපේක්ෂව 2024 වසරේ ජනවාරි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 488ක් විය. 2022 වසරේ දී කැපී පෙනෙන යථාවත් වීමක් වාර්තා කිරීමෙන් පසු, විටින් විට සිදුවන උච්චාවචනයන් නොතකා, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ පුළුල් පදනමකින් ඉහළ යෑමේ ප්‍රවණතාවක් අඛණ්ඩව වාර්තා කළේය.

**රූප සටහන 10: මාසික විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




මූලයන්: බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

---
4 තාවකාලික

## මූල්‍ය ලැබීම්

පසුගිය මාස කිහිපය තුළ අඛණ්ඩව ශුද්ධ ගෙවීමක් වාර්තා කළ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශ ආයෝජන 2024 වසරේ ජනවාරි මාසයේ දී ද එ.ජ. ඩොලර් මිලියන 10ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. මේ අතර, ප්‍රාථමික සහ ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ විදේශීය ලැබීම් 2023 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 5ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය.

## ජාත්‍යන්තර සංචිත

දළ නිල සංචිත 2024 වසරේ ජනවාරි මස අවසානය වන විට එ. ජ. ඩොලර් බිලියන 4.5ක් දක්වා අඛණ්ඩව ඉහළ ගියේය. චීන මහජන බැංකුවෙන් ලද එ.ජ. ඩොලර් බිලියන 1.4කට පමණ සමාන විදේශ විනිමය හුවමාරු පහසුකම මෙයට ඇතුළත් වූ අතර, එය භාවිතා කිරීම යම් කොන්දේසි වලට යටත් වේ. දළ නිල සංචිත ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ මහ බැංකුව විසින් ශුද්ධ පදනම මත දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් සැලකිය යුතු ලෙස විදේශ විනිමය මිලදී ගැනීමයි. සමස්තයක් වශයෙන්, මහ බැංකුව 2024 වසරේ ජනවාරි මාසය තුළ දී ශුද්ධ පදනම මත එ.ජ. ඩොලර් මිලියන 245ක් පමණ මිලදී ගෙන ඇත.

**රූප සටහන 11: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයෙහි හැසිරීම

**දෙසැම්බර් මස අග භාගයේ සිට නිරීක්ෂණය වූ විනිමය අනුපාතිකයෙහි අතිප්‍රමාණය වීමේ ප්‍රවණතාවය 2024 වසරේ මේ දක්වා අඛණ්ඩව පැවතුණි.** 2024 වසරේ පෙබරවාරි මස 29 දක්වා වසර තුළ දී ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 4.4කින් අතිප්‍රමාණය විය. මේ අතර, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින්, 2024 වසරේ පෙබරවාරි මස 29 දක්වා කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල යූරෝ, ස්ටර්ලින් පවුම, ජපන් යෙන්, ඉන්දියානු රුපියල, සහ ඕස්ට්‍රේලියානු ඩොලරය වැනි අනෙකුත් ප්‍රධාන මුදල් වර්ගවලට සාපේක්ෂව අතිප්‍රමාණය විය. රුපියලෙහි වූ නාමික අතිප්‍රමාණයට අනුකූලව 2024 වසරේ ජනවාරි මාසය තුළ දී මුදල් වර්ග 24කින් සැදුම් ලත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතිකය (මූ.ස.වි.අ.) අතිප්‍රමාණය විය. කෙසේ වෙතත්, මූ.ස.වි.අ. 24හි දර්ශකය විදේශීය තරඟකාරිත්වය පවත්වා ගැනීම පෙන්නුම් කරමින් දර්ශකාංක 100 සීමාවට වඩා බෙහෙවින් අඩු මට්ටමක පැවතුණි.

**රූප සටහන 12: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි වෙනස් වීම**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 13: මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතිකයෙහි වෙනස්වීම**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 1: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස් වීම***

| මුදල් ඒකකය | 2022 | 2023 | 2024 (පෙබරවාරි 29 දක්වා) |
|---|---|---|---|
| එ.ජ. ඩොලරය | -44.8% | +12.1% | +4.4% |
| යූරෝ | -41.4% | +7.9% | +6.8% |
| ස්ටර්ලින් පවුම | -38.1% | +6.0% | +5.0% |
| ජපන් යෙන් | -36.4% | +19.5% | +10.8% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -40.8% | +10.8% | +9.8% |
| ඉන්දියානු රුපියල | -38.6% | +12.6% | +4.2% |

* අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+)

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ඉදිරි දින දර්ශනයට අනුව, 2024 වසරේ පෙබරවාරි මාසය සඳහා වන විදේශීය අංශයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ පුවත්පත් නිවේදනය 2024 වසරේ මාර්තු මස 28 වන දින නිකුත් කරනු ඇත.**

ඇමුණුම I :

### වෙළඳ අංශයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ සාරාංශය (අ)

| කාණ්ඩය | 2022 (එ.ජ.ඩො. මිලියන) | 2023 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2023 ජනවාරි (එ.ජ.ඩො. මිලියන) | 2024 ජනවාරි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩ අපනයන | 13,106 | 11,911 | -9.1 | 978 | 971 | -0.8 |
| වෙළඳ භාණ්ඩ ආනයන | 18,291 | 16,811 | -8.1 | 1,423 | 1,512 | 6.2 |
| වෙළඳ ශේෂය | -5,185 | -4,900 | | -445 | -541 | |
| සේවා අංශයට වූ ලැබීම් | | | | | | |
| *ඒවායින්,* | | | | | | |
| සංචාරක ඉපැයීම් | 1.136 (ආ) | 2,068 (c) | 82.0 | 154 (ඇ) | 342 (ඈ) | 122.7 |
| පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන සේවා | | | | 62 | 43 | -30.6 |
| මුහුදු ප්‍රවාහනය (නැව් කුලී) | | | | 44 | 54 | 21.8 |
| ගුවන් ප්‍රවාහනය (ගුවන් කුලී) | | | | 12 | 3 | -75.8 |
| ගුවන් ප්‍රවාහනය (මගී ගාස්තු) | | | | 24 | 29 | 17.6 |
| සේවා අංශයේ ගෙවීම් | | | | | | |
| *ඒවායින්,* | | | | | | |
| විදේශ සංචාර | | | | 13 | 15 | 11.1 |
| මුහුදු ප්‍රවාහනය (නැව් කුලී) | | | | 22 | 31 | 39.1 |
| ගුවන් ප්‍රවාහනය (ගුවන් කුලී) | | | | 12 | 4 | -68.3 |
| ගුවන් ප්‍රවාහනය (මගී ගාස්තු) | | | | 16 | 19 | 18.9 |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 3,789 | 5,970 | 57.5 | 437 | 488 | 11.4 |
| පුද්ගලික සංක්‍රාම සඳහා ගෙවීම් | | | | 10 | 9 | -14.6 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | 182 | 18 | | 1 | -5 | |
| රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ දළ විදේශ විනිමය ලැබීම් | 69 | 824 | | 3 | 51 | |
| සමස්ත ශේෂය | -2,806 | 2,826 | | 211 | 178 | |
| ***විශේෂිත අයිතමයන්*** | | | | | | |
| සංචාරක පැමිණීම් | 719,978 | 1,487,303 | | 102,545 | 208,253 | |
| විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් | 311,056 (ඊ) | 297,305 | | 24,182 | 25,249 | |

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) 2022 වසරේ දී සංචාරක සංවර්ධන අධිකාරිය විසින් පවත්වනු ලැබූ සමීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව සංශෝධනය කරන ලදී
(ඇ) 2023 වසරේ දී සංචාරක සංවර්ධන අධිකාරිය විසින් පවත්වනු ලැබූ සමීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව
(ඈ) 2024 වසරේ දී සංචාරක සංවර්ධන අධිකාරිය විසින් පවත්වනු ලැබූ සමීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව
(ඉ) ප්‍රාථමික සහ ද්විතීයික ගනුදෙනු ඇතුළත් වේ
(ඊ) සංශෝධිත

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් 'මාසික වෙළඳ විවරණිකාව' ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.
සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව (https://www.cbsl.gov.lk/si/node/6181).

ඇමුණුම II:

## ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්ගීකරණයට අනුව වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)

| කාණ්ඩය | 2022 එ.ජ.ඩො. මිලියන | 2023 එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | 2023 ජනවාරි එ.ජ.ඩො. මිලියන | 2024 ජනවාරි එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **10,465.3** | **9,277.7** | **-11.3** | **781.3** | **771.5** | **-1.3** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 519.5 | 539.3 | 3.8 | 34.7 | 44.0 | 26.8 |
| සත්ත්ව ආහාර | 170.5 | 145.6 | -14.6 | 16.2 | 8.7 | -46.3 |
| රෙදිපිළි හා ඇඟලුම් | 5,952.0 | 4,878.9 | -18.0 | 424.4 | 381.2 | -10.2 |
| එයින්, ඇඟලුම් | 5,483.1 | 4,440.6 | -19.0 | 388.9 | 349.1 | -10.2 |
| රෙදිපිළි | 353.7 | 338.1 | -4.4 | 27.4 | 23.0 | -16.1 |
| අනෙකුත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය | 115.2 | 100.2 | -13.1 | 8.1 | 9.1 | 12.5 |
| රබර් නිෂ්පාදිත | 977.0 | 902.2 | -7.7 | 72.7 | 80.0 | 10.2 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 450.6 | 500.0 | 11.0 | 54.1 | 48.2 | -11.0 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 580.9 | 598.2 | 3.0 | 50.8 | 40.0 | -21.3 |
| ප්‍රවාහන උපකරණ | 129.3 | 149.3 | 15.4 | 5.7 | 4.8 | -16.0 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 568.0 | 539.4 | -5.0 | 46.4 | 85.9 | 85.0 |
| රසායනික නිෂ්පාදිත | 223.5 | 193.5 | -13.4 | 12.7 | 18.9 | 48.8 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 136.9 | 114.0 | -16.7 | 9.7 | 8.8 | -9.9 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 53.1 | 55.1 | 3.9 | 7.6 | 3.6 | -52.5 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 85.8 | 71.2 | -17.0 | 5.2 | 4.3 | -18.8 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 60.9 | 56.3 | -7.6 | 4.1 | 4.6 | 10.6 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 176.7 | 178.3 | 0.9 | 10.3 | 14.1 | 37.3 |
| පිඟන්මැටි නිෂ්පාදිත | 38.1 | 34.0 | -10.7 | 3.0 | 1.8 | -40.3 |
| වෙනත් කාර්මික අපනයන | 342.4 | 322.5 | -5.8 | 23.6 | 22.8 | -3.4 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **2,568.0** | **2,566.5** | **-0.1** | **191.0** | **195.5** | **2.4** |
| තේ | 1,258.8 | 1,309.9 | 4.1 | 99.6 | 102.2 | 2.6 |
| රබර් | 41.4 | 28.0 | -32.2 | 3.2 | 1.7 | -47.4 |
| පොල් | 400.3 | 336.8 | -15.9 | 22.0 | 24.8 | 13.0 |
| කුළුබඩු | 368.7 | 392.9 | 6.5 | 34.1 | 27.9 | -18.2 |
| එළවළු | 26.7 | 27.7 | 3.8 | 2.4 | 1.9 | -19.6 |
| සකස් නොකළ දුම්කොළ | 24.4 | 28.1 | 15.3 | 0.7 | 1.7 | 130.9 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 178.8 | 180.9 | 1.2 | 8.1 | 12.3 | 51.7 |
| මුහුදු ආහාර | 269.0 | 262.2 | -2.5 | 20.9 | 23.0 | 9.8 |
| **3. ඛනිජ අපනයන** | **50.0** | **38.5** | **-23.1** | **3.6** | **1.4** | **-60.2** |
| **4. වර්ග නොකළ අපනයන** | **23.2** | **28.0** | **20.8** | **2.3** | **2.3** | **-0.6** |
| **මුළු අපනයන** | **13,106.4** | **11,910.7** | **-9.1** | **978.2** | **970.7** | **-0.8** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

**ඇමුණුම III:**

**සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව අපනයන සංයුතිය (අ)**

| කාණ්ඩය | 2022 එ.ජ.ඩො. මිලියන | 2023 එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | 2023 ජනවාරි එ.ජ.ඩො. මිලියන | 2024 ජනවාරි එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **0. ආහාර හා සජීවී සතුන්** | **2,701.8** | **2,761.0** | **2.2** | **209.2** | **211.1** | **0.9** |
| 03 මත්ස්‍යයින් හා ඒ ආශ්‍රිත සැකසුම් | 301.2 | 301.7 | 0.2 | 23.8 | 26.7 | 12.5 |
| 04 ධාන්‍ය හා ධාන්‍ය සැකසුම් | 77.5 | 77.6 | 0.2 | 5.9 | 5.8 | -0.7 |
| 05 එළවළු හා පලතුරු | 449.0 | 430.6 | -4.1 | 25.6 | 31.0 | 21.2 |
| 07 කෝපි, තේ, කොකෝවා, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 1,611.1 | 1,701.3 | 5.6 | 133.3 | 130.0 | -2.5 |
| **1. පාන වර්ග හා දුම්කොළ** | **135.8** | **158.5** | **16.7** | **9.5** | **10.9** | **14.0** |
| 11 පාන වර්ග | 46.7 | 64.3 | 37.7 | 4.0 | 6.0 | 49.3 |
| 12 දුම්කොළ හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදිත | 89.2 | 94.2 | 5.7 | 5.5 | 4.9 | -11.7 |
| **2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය** | **450.3** | **380.5** | **-15.5** | **32.4** | **25.1** | **-22.5** |
| 23 සකස් නොකළ රබර් | 42.4 | 29.5 | -30.6 | 3.3 | 1.8 | -46.0 |
| 26 රෙදිපිළි සඳහා යොදාගනු ලබන කෙඳි වර්ග හා ඒවායේ අපද්‍රව්‍ය | 228.6 | 210.7 | -7.9 | 17.2 | 13.5 | -21.5 |
| **3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය** | **568.0** | **539.4** | **-5.0** | **46.4** | **85.9** | **85.0** |
| 33 ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 544.1 | 539.4 | -0.9 | 46.4 | 75.7 | 63.0 |
| 34 ස්වාභාවික හා නිෂ්පාදිත ගෑස් වර්ග | 23.9 | - | - | - | 10.2 | - |
| **4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි** | **89.9** | **69.6** | **-22.6** | **4.0** | **6.1** | **53.7** |
| 42 පිරිපහදු කළ හෝ නොකළ, නිස්සාරණයට ලක් කළ ස්ථායී එළවළු මේද හා තෙල් | 75.4 | 67.5 | -10.5 | 3.9 | 5.4 | 39.1 |
| **5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන)** | **271.5** | **234.2** | **-13.7** | **15.8** | **24.1** | **52.2** |
| **6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ** | **1,875.9** | **1,875.8** | **-0.01** | **155.2** | **159.6** | **2.8** |
| 62 රබර් නිෂ්පාදන (අන් තැනක සඳහන් නොවන) | 680.3 | 675.1 | -0.8 | 51.9 | 60.4 | 16.2 |
| 65 රෙදිපිළි සඳහා යොදාගනු ලබන නූල්, රෙදි, සකස් කරන ලද උපාංග, හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 447.1 | 398.9 | -10.8 | 30.3 | 30.4 | 0.6 |
| 66 ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 510.4 | 559.2 | 9.6 | 58.2 | 50.2 | -13.9 |
| **7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ** | **692.1** | **730.9** | **5.6** | **55.3** | **44.1** | **-20.3** |
| 77 විද්‍යුත් යන්ත්‍රසූත්‍ර, උපකරණ හා උපාංග සහ ඒ ආශ්‍රිත විද්‍යුත් කොටස් (අන් තැනක සඳහන් නොවන) | 364.2 | 352.8 | -3.1 | 30.8 | 22.8 | -26.1 |
| **8. විවිධ නිෂ්පාදන උපාංග** | **6,320.3** | **5,160.4** | **-18.4** | **450.3** | **403.8** | **-10.3** |
| 84 නිමි ඇඳුම් හා ඇඟලුම් සකස් කිරීමට ගන්නා උපාංග | 5,832.0 | 4,713.8 | -19.2 | 412.8 | 371.0 | -10.1 |
| **9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු** | **0.8** | **0.4** | **-45.8** | **0.04** | **0.1** | **82.1** |
| **මුළු අපනයන** | **13,106.4** | **11,910.7** | **-9.1** | **978.2** | **970.7** | **-0.8** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි පළමු අංකයෙන් අංශය ද පළමු අංක දෙකෙන් කාණ්ඩය ද දැක්වේ. තෝරා ගත් කාණ්ඩ පමණක් ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය පිළිබඳ තවදුරටත් දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017 හි විශේෂ සටහන 04 බලන්න.
https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2017/si/9_Chapter_05.pdf

ඇමුණුම IV:

## ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්ගීකරණයට අනුව වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)

| කාණ්ඩය | 2022 එ.ජ.ඩො. මිලියන | 2023 එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | 2023 ජනවාරි එ.ජ.ඩො. මිලියන | 2024 ජනවාරි එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **2,813.0** | **3,043.9** | **8.2** | **218.5** | **281.3** | **28.8** |
| ආහාර හා පාන වර්ග | 1,607.9 | 1,693.0 | 5.3 | 118.3 | 156.6 | 32.3 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 430.5 | 116.9 | -72.8 | 15.3 | 23.6 | 54.2 |
| කිරි ආශ්‍රිත නිෂ්පාදිත | 225.3 | 273.7 | 21.5 | 16.2 | 20.0 | 23.4 |
| එළවළු (ආ) | 318.4 | 358.6 | 12.6 | 24.1 | 33.8 | 40.1 |
| මුහුදු ආහාර | 66.4 | 79.4 | 19.6 | 3.6 | 8.6 | 139.4 |
| සීනි හා රසකැවිලි | 257.8 | 435.5 | 68.9 | 32.8 | 30.1 | -8.1 |
| කුළුබඩු | 136.6 | 133.4 | -2.4 | 9.9 | 10.9 | 9.2 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 172.8 | 295.5 | 71.0 | 16.4 | 29.6 | 80.6 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 1,205.1 | 1,350.9 | 12.1 | 100.2 | 124.8 | 24.6 |
| පෞද්ගලික රථවාහන | 11.7 | 27.7 | 136.9 | 1.5 | 4.7 | 204.7 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 533.4 | 667.0 | 25.0 | 51.0 | 56.2 | 10.3 |
| ගෘහ උපකරණ | 85.5 | 72.4 | -15.4 | 4.2 | 7.9 | 85.2 |
| රෙදිපිළි හා උපාංග | 215.6 | 170.0 | -21.1 | 18.2 | 18.3 | 0.4 |
| විදුලි සංදේශ උපකරණ | 69.0 | 98.8 | 43.3 | 3.7 | 8.6 | 135.8 |
| ගෘහ හා දැව භාණ්ඩ | 116.3 | 122.1 | 5.0 | 7.0 | 11.9 | 70.7 |
| වෙනත් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 173.7 | 192.9 | 11.1 | 14.5 | 17.1 | 18.1 |
| **2. අන්තර් භාණ්ඩ** | **12,438.8** | **11,006.6** | **-11.5** | **1,005.9** | **980.5** | **-2.5** |
| ඉන්ධන | 4,896.8 | 4,702.6 | -4.0 | 516.5 | 417.5 | -19.2 |
| එයින්, බොරතෙල් | 483.8 | 1,137.5 | 135.1 | 143.0 | 133.6 | -6.5 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 4,048.2 | 3,095.4 | -23.5 | 287.1 | 245.3 | -14.6 |
| ගල්අඟුරු | 364.8 | 469.8 | 28.8 | 86.4 | 38.5 | -55.4 |
| දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ වර්ග | 203.8 | 268.4 | 31.7 | 21.2 | 14.8 | -30.0 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 3,065.2 | 2,371.2 | -22.6 | 217.5 | 224.5 | 3.2 |
| කඩදාසි හා ඝන කඩදාසි | 465.9 | 412.4 | -11.5 | 37.0 | 36.3 | -2.0 |
| කෘෂිකාර්මික යෙදවුම් | 214.5 | 233.8 | 9.0 | 22.3 | 20.6 | -7.7 |
| තිරිඟු හා ඉරිඟු | 303.1 | 338.2 | 11.6 | 5.6 | 16.4 | 194.1 |
| මූල ලෝහ | 323.2 | 313.8 | -2.9 | 13.1 | 45.0 | 243.4 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 650.8 | 474.6 | -27.1 | 37.4 | 41.0 | 9.6 |
| රසායනික නිෂ්පාදිත | 966.2 | 814.7 | -15.7 | 60.5 | 77.0 | 27.2 |
| පොහොර | 275.9 | 235.0 | -14.8 | 9.6 | 9.0 | -5.9 |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 334.7 | 200.2 | -40.2 | 14.2 | 23.5 | 65.3 |
| ඛනිජ නිෂ්පාදිත | 123.7 | 80.9 | -34.6 | 5.6 | 9.3 | 66.7 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 615.0 | 560.7 | -8.8 | 45.4 | 45.6 | 0.4 |
| **3. ආයෝජන භාණ්ඩ** | **3,030.5** | **2,744.6** | **-9.4** | **198.9** | **249.4** | **25.4** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 1,969.0 | 1,867.6 | -5.1 | 132.6 | 166.0 | 25.1 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 926.3 | 775.1 | -16.3 | 63.1 | 74.8 | 18.5 |
| ප්‍රවාහන උපකරණ | 132.1 | 98.5 | -25.4 | 2.7 | 8.4 | 207.8 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 3.0 | 3.3 | 9.2 | 0.4 | 0.3 | -27.5 |
| **4. වර්ග නොකළ ආනයන** | **8.8** | **16.0** | **82.9** | **0.1** | **0.6** | **348.1** |
| **මුළු ආනයන** | **18,291.0** | **16,811.1** | **-8.1** | **1,423.4** | **1,511.8** | **6.2** |
| **එයින් ඉන්ධන නොවන ආනයන** | **13,394.2** | **12,108.5** | **-9.6** | **906.9** | **1,094.3** | **20.7** |

(අ) තාවකාලික
(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

ඇමුණුම V:

**සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව ආනයන සංයුතිය (අ)**

| කාණ්ඩය | 2022 එ.ජ.ඩො. මිලියන | 2023 එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | 2023 ජනවාරි එ.ජ.ඩො. මිලියන | 2024 ජනවාරි එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **0. ආහාර හා සජීවී සතුන්** | **2,162.2** | **2,186.1** | **1.1** | **145.2** | **180.8** | **24.5** |
| 02 කිරි ආශ්‍රිත නිෂ්පාදිත හා කුරුලු බිත්තර | 225.7 | 289.6 | 28.3 | 16.2 | 20.3 | 24.9 |
| 03 මත්ස්‍යයින් හා ඒ ආශ්‍රිත සැකසුම් | 67.7 | 80.5 | 18.9 | 3.7 | 8.7 | 137.4 |
| 04 ධාන්‍ය හා ධාන්‍ය සැකසුම් | 729.0 | 452.7 | -37.9 | 20.6 | 39.4 | 91.2 |
| 05 එළවළු හා පලතුරු | 365.4 | 402.4 | 10.1 | 27.1 | 39.0 | 44.0 |
| 06 සීනි, සීනි ආශ්‍රිත සැකසුම් හා පැණි | 257.8 | 435.6 | 68.9 | 32.8 | 30.1 | -8.1 |
| 07 කෝපි, තේ, කොකෝවා, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 180.0 | 180.8 | 0.5 | 13.4 | 14.5 | 8.8 |
| **1. පාන වර්ග හා දුම්කොළ** | **101.0** | **122.0** | **20.8** | **11.6** | **7.3** | **-37.1** |
| **2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය** | **465.3** | **328.8** | **-29.3** | **25.8** | **35.5** | **37.8** |
| 23 සකස් නොකළ රබර් | 283.6 | 157.3 | -44.5 | 10.3 | 20.8 | 102.5 |
| 26 රෙදිපිළි සඳහා යොදාගනු ලබන කෙඳි වර්ග හා ඒවායේ අපද්‍රව්‍ය | 30.5 | 33.5 | 9.7 | 3.8 | 2.0 | -48.1 |
| **3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය** | **4,896.8** | **4,702.6** | **-4.0** | **516.5** | **417.5** | **-19.2** |
| 33 ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 4,288.0 | 3,948.0 | -7.9 | 396.3 | 352.0 | -11.2 |
| 34 ස්වාභාවික හා නිෂ්පාදිත ගෑස් වර්ග | 243.9 | 284.9 | 16.8 | 33.8 | 26.9 | -20.4 |
| **4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි** | **79.8** | **162.9** | **104.2** | **5.0** | **16.9** | **241.5** |
| 42 පිරිපහදු කළ හෝ නොකළ, නිස්සාරණයට ලක් කළ ස්ථායී එළවළු මේද හා තෙල් | 65.6 | 151.1 | 130.3 | 4.0 | 16.0 | 296.8 |
| **5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන)** | **2,392.2** | **2,150.5** | **-10.1** | **155.6** | **178.0** | **14.4** |
| 54 බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 502.3 | 618.4 | 23.1 | 47.5 | 51.5 | 8.4 |
| 56 පොහොර | 275.8 | 234.8 | -14.8 | 9.6 | 9.0 | -6.2 |
| 57 ප්‍රාථමික ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික් | 438.6 | 308.6 | -29.6 | 21.7 | 26.3 | 21.0 |
| 58 ප්‍රාථමික නොවන ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික් | 174.7 | 131.9 | -24.5 | 13.4 | 10.7 | -20.1 |
| **6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ** | **5,114.1** | **4,267.8** | **-16.5** | **355.6** | **408.9** | **15.0** |
| 64 කඩදාසි, ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 436.7 | 399.1 | -8.6 | 36.2 | 34.4 | -4.8 |
| 65 රෙදිපිළි සඳහා යොදාගනු ලබන නූල්, රෙදි, සකස් කරන ලද උපාංග, හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 2,991.0 | 2,300.6 | -23.1 | 209.0 | 218.8 | 4.7 |
| 66 ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 485.0 | 488.9 | 0.8 | 38.7 | 42.6 | 10.0 |
| 67 යකඩ හා වානේ | 456.3 | 428.4 | -6.1 | 22.2 | 58.3 | 162.4 |
| **7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ** | **2,278.1** | **2,137.9** | **-6.2** | **145.9** | **196.8** | **34.9** |
| 72 ඇතැම් කර්මාන්ත සඳහා විශේෂයෙන් සකස් කරන ලද යන්ත්‍රසූත්‍ර | 396.5 | 264.1 | -33.4 | 18.9 | 25.3 | 33.5 |
| 74 සාමාන්‍ය කාර්මික යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ යන්ත්‍ර කොටස් (අන් තැනක සඳහන් නොවන) | 430.9 | 359.4 | -16.6 | 27.7 | 34.4 | 24.0 |
| 75 කාර්යාලයීය යන්ත්‍රසූත්‍ර හා ස්වයංක්‍රීය දත්ත සැකසුම් යන්ත්‍ර | 161.7 | 146.2 | -9.6 | 10.9 | 13.2 | 21.6 |
| 76 විදුලි සන්දේශ සහ ශබ්ද පටිගත කිරීම හා ප්‍රතිනිෂ්පාදන කටයුතු සඳහා යොදාගනු ලබන උපකරණ | 231.6 | 266.7 | 15.1 | 13.1 | 23.0 | 75.3 |
| 77 විද්‍යුත් යන්ත්‍රසූත්‍ර, උපකරණ හා උපාංග (අන් තැනක සඳහන් නොවන) සහ ඒ ආශ්‍රිත විද්‍යුත් කොටස් | 633.1 | 541.8 | -14.4 | 42.4 | 44.5 | 5.0 |
| 78 රථවාහන | 158.2 | 140.4 | -11.2 | 9.6 | 15.9 | 65.9 |
| **8. විවිධ නිෂ්පාදන උපාංග** | **791.3** | **738.6** | **-6.7** | **61.9** | **69.6** | **12.4** |
| 84 නිමි ඇඳුම් හා ඇඟලුම් සකස් කිරීමට ගන්නා උපාංග | 191.5 | 146.3 | -23.6 | 16.5 | 16.9 | 1.9 |
| 87 වෘත්තීමය, විද්‍යාත්මක හා පාලන මෙවලම් සහ උපකරණ (අන් තැනක සඳහන් නොවන) | 143.2 | 159.2 | 11.1 | 10.6 | 12.4 | 16.7 |
| **9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු** | **10.3** | **13.8** | **34.6** | **0.3** | **0.5** | **84.9** |
| **මුළු ආනයන** | **18,291.0** | **16,811.1** | **-8.1** | **1,423.4** | **1,511.8** | **6.2** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි පළමු අංකයෙන් අංශය ද පළමු අංක දෙකෙන් කාණ්ඩය ද දැක්වේ. තෝරා ගත් කාණ්ඩ පමණක් ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය පිළිබඳ තවදුරටත් දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017හි විශේෂ සටහන 04 බලන්න.
https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2017/si/9_Chapter_05.pdf

ඇමුණුම VI:

## සේවා ගිණුම - ලැබීම් (අ)

| | ජන.-23 (එ.ජ.ඩො. මිලියන) | ජන.-24 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|
| **සේවා** | **412.5** | **589.7** | **43.0** |
| **නිෂ්පාදන සේවා** | **1.4** | **1.2** | **-11.2** |
| **නඩත්තු සහ අලුත්වැඩියා සේවා (අන් තැනක සඳහන් නොවන)** | **3.7** | **1.5** | **-59.2** |
| **ප්‍රවාහනය** | **141.0** | **139.0** | **-1.4** |
| මුහුදු ප්‍රවාහනය | 70.2 | 82.2 | 17.1 |
| නැව් කුලී | 44.4 | 54.0 | 21.8 |
| වෙනත් | 25.8 | 27.7 | 7.3 |
| ගුවන් ප්‍රවාහනය | 70.8 | 56.1 | -20.7 |
| මගී ගාස්තු | 24.3 | 28.6 | 17.6 |
| ගුවන් කුලී | 12.1 | 2.9 | -75.8 |
| වෙනත් | 34.4 | 24.6 | -28.5 |
| **සංචාරක** | **153.5** | **341.8** | **122.7** |
| **ඉදිකිරීම්** | **17.2** | **14.7** | **-14.4** |
| විදේශයන්හි ඉදිකිරීම් | 1.0 | 4.6 | 369.7 |
| දේශීය ඉදිකිරීම් | 5.4 | 4.7 | -13.6 |
| ගෘහ නිර්මාණ, ඉංජිනේරු සහ අනෙකුත් තාක්ෂණික සේවා | 10.8 | 5.4 | -49.8 |
| **රක්ෂණ හා විශ්‍රාම වැටුප්** | **1.4** | **1.6** | **14.6** |
| සෘජු රක්ෂණය | 1.4 | 0.9 | -33.1 |
| ප්‍රතිරක්ෂණය | 0.04 | 0.7 | |
| **මූල්‍ය සේවා** | **5.8** | **1.9** | **-67.6** |
| **බුද්ධිමය දේපල භාවිතය සඳහා ගාස්තු (අන් තැනක සඳහන් නොවන)** | **0.04** | **4.2** | |
| **විදුලි සංදේශ, පරිගණක සහ තොරතුරු සේවා** | **68.9** | **47.3** | **-31.2** |
| විදුලි සංදේශ සේවා | 6.7 | 7.0 | 5.0 |
| පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන සේවා | 62.2 | 43.2 | -30.6 |
| පරිගණක සේවා | 61.1 | 42.5 | -30.5 |
| තොරතුරු සේවා | 1.1 | 0.7 | -35.9 |
| **වෙනත් ව්‍යාපාරික සේවා** | **15.9** | **34.3** | **115.1** |
| පර්යේෂණ සහ සංවර්ධන සේවා | 1.4 | 3.8 | 172.7 |
| වෘත්තීය සහ කළමනාකරණ උපදේශන සේවා | 4.1 | 14.0 | 243.9 |
| තාක්ෂණික, වෙළඳාම ආශ්‍රිත සහ වෙනත් ව්‍යාපාරික සේවා | 10.5 | 16.4 | 57.1 |
| **පුද්ගලික, සංස්කෘතික සහ විනෝදාත්මක සේවා** | **3.5** | **1.9** | **-43.9** |
| ශ්‍රව්‍ය දෘෂ්‍ය සහ ඊට අදාළ සේවා | 0.02 | 0.9 | |
| වෙනත් පුද්ගලික, සංස්කෘතික සහ විනෝදාත්මක සේවා | 3.4 | 1.1 | -68.9 |
| **රජයේ භාණ්ඩ හා සේවා වියදම් (අන් තැනක සඳහන් නොවන)** | **0.2** | **0.1** | **-14.7** |

(අ) තාවකාලික, සංචාරක ඉපැයීම් හැර අනෙකුත් සියලුම දත්ත අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතියේ දත්ත මත පදනම් වේ. සංචාරක ඉපැයීම් දත්ත, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් කරන ලද සමීක්ෂණය මත පදනම් වේ

**මූලයන්**: අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය - ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

ඇමුණුම VII:

## සේවා ගිණුම - ගෙවීම්

| | ජන.-23 (එ.ජ.ඩො. මිලියන) | ජන.-24 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|
| **සේවා** | **147.8** | **182.9** | **23.8** |
| **නිෂ්පාදන සේවා** | **14.2** | **16.8** | **17.9** |
| **නඩත්තු සහ අලුත්වැඩියා සේවා (අන් තැනක සඳහන් නොවන)** | **0.2** | **0.3** | **34.0** |
| **ප්‍රවාහනය** | **61.2** | **64.8** | **5.9** |
| මුහුදු ප්‍රවාහනය | 24.3 | 31.6 | 30.0 |
| නැව් කුලී | 22.1 | 30.8 | 39.1 |
| වෙනත් | 2.1 | 0.8 | -63.5 |
| ගුවන් ප්‍රවාහනය | 36.2 | 32.5 | -10.4 |
| මගී ගාස්තු | 16.1 | 19.2 | 18.9 |
| ගුවන් කුලී | 12.3 | 3.9 | -68.3 |
| වෙනත් | 7.7 | 9.4 | 21.1 |
| **සංචාරක** | **13.3** | **14.7** | **11.1** |
| **ඉදිකිරීම්** | **12.8** | **3.3** | **-74.1** |
| විදේශයන්හි ඉදිකිරීම් | 0.0 | 0.3 | |
| දේශීය ඉදිකිරීම් | 9.5 | 0.4 | -95.5 |
| ගෘහ නිර්මාණ, ඉංජිනේරු සහ අනෙකුත් තාක්ෂණික සේවා | 3.3 | 2.6 | -21.1 |
| **රක්ෂණ හා විශ්‍රාම වැටුප්** | **1.6** | **4.3** | **160.7** |
| සෘජු රක්ෂණය | 0.6 | 1.0 | 64.4 |
| ප්‍රතිරක්ෂණය | 1.0 | 3.3 | 213.8 |
| **මූල්‍ය සේවා** | **3.7** | **6.6** | **80.3** |
| **බුද්ධිමය දේපල භාවිතය සඳහා ගාස්තු (අන් තැනක සඳහන් නොවන)** | **5.0** | **7.4** | **47.3** |
| **විදුලි සංදේශ, පරිගණක සහ තොරතුරු සේවා** | **17.2** | **15.0** | **-12.7** |
| විදුලි සංදේශ සේවා | 3.6 | 2.8 | -23.7 |
| පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන සේවා | 13.6 | 12.2 | -9.7 |
| පරිගණක සේවා | 9.9 | 10.6 | 6.5 |
| තොරතුරු සේවා | 3.6 | 1.7 | -53.9 |
| **වෙනත් ව්‍යාපාරික සේවා** | **18.5** | **48.6** | **162.4** |
| පර්යේෂණ සහ සංවර්ධන සේවා | 6.0 | 6.7 | 10.5 |
| වෘත්තීය සහ කළමනාකරණ උපදේශන සේවා | 3.5 | 23.3 | 557.4 |
| තාක්ෂණික, වෙළඳාම ආශ්‍රිත සහ වෙනත් ව්‍යාපාරික සේවා | 8.9 | 18.6 | 108.8 |
| **පුද්ගලික, සංස්කෘතික සහ විනෝදාත්මක සේවා** | **0.004** | **1.1** | |
| ශ්‍රව්‍ය දෘෂ්‍ය සහ ඊට අදාළ සේවා | 0.004 | 1.0 | |
| වෙනත් පුද්ගලික, සංස්කෘතික සහ විනෝදාත්මක සේවා | 0.0 | 0.1 | |
| **රජයේ භාණ්ඩ හා සේවා වියදම් (අන් තැනක සඳහන් නොවන)** | **0.05** | **0.1** | **136.0** |

(අ) තාවකාලික

**මූලය:** අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය - ශ්‍රී ලංකා මහ බැංකුව

ඇමුණුම VIII:

## සේවා ගිණුම - ශුද්ධ

| | ජන.-23 (එ.ජ.ඩො. මිලියන) | ජන.-24 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|
| **සේවා** | **264.7** | **406.8** | **53.7** |
| **නිෂ්පාදන සේවා** | **-12.8** | **-15.5** | **21.1** |
| **නඩත්තු සහ අලුත්වැඩියා සේවා (අන් තැනක සඳහන් නොවන)** | **3.5** | **1.3** | **-64.3** |
| **ප්‍රවාහනය** | **79.8** | **74.1** | **-7.1** |
| මුහුදු ප්‍රවාහනය | 45.9 | 50.6 | 10.3 |
| නැව් කුලී | 22.2 | 23.3 | 4.7 |
| වෙනත් | 23.8 | 27.0 | 13.5 |
| ගුවන් ප්‍රවාහනය | 34.6 | 23.7 | -31.6 |
| මගී ගාස්තු | 8.2 | 9.4 | 15.1 |
| ගුවන් කුලී | -0.3 | -1.0 | 293.0 |
| වෙනත් | 26.7 | 15.3 | -42.8 |
| **සංචාරක** | **140.2** | **327.0** | **133.2** |
| **ඉදිකිරීම්** | **4.3** | **11.4** | **162.1** |
| විදේශයන්හි ඉදිකිරීම් | 1.0 | 4.3 | 340.3 |
| දේශීය ඉදිකිරීම් | -4.1 | 4.3 | -204.2 |
| ගෘහ නිර්මාණ, ඉංජිනේරු සහ අනෙකුත් තාක්ෂණික සේවා | 7.5 | 2.8 | -62.5 |
| **රක්ෂණ හා විශ්‍රාම වැටුප්** | **-0.2** | **-2.7** | |
| සෘජු රක්ෂණය | 0.8 | -0.04 | -105.7 |
| ප්‍රතිරක්ෂණය | -1.0 | -2.6 | 156.9 |
| **මූල්‍ය සේවා** | **2.2** | **-4.7** | **-319.5** |
| **බුද්ධිමය දේපල භාවිතය සඳහා ගාස්තු (අන් තැනක සඳහන් නොවන)** | **-5.0** | **-3.1** | **-36.8** |
| **විදුලි සංදේශ, පරිගණක සහ තොරතුරු සේවා** | **51.7** | **32.3** | **-37.4** |
| විදුලි සංදේශ සේවා | 3.0 | 4.2 | 39.4 |
| පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන සේවා | 48.6 | 30.9 | -36.4 |
| පරිගණක සේවා | 51.2 | 31.9 | -37.6 |
| තොරතුරු සේවා | -2.6 | -1.0 | -61.4 |
| **වෙනත් ව්‍යාපාරික සේවා** | **-2.6** | **-14.3** | **455.5** |
| පර්යේෂණ සහ සංවර්ධන සේවා | -4.6 | -2.8 | -38.8 |
| වෘත්තීය සහ කළමනාකරණ උපදේශන සේවා | 0.5 | -9.2 | |
| තාක්ෂණික, වෙළඳාම ආශ්‍රිත සහ වෙනත් ව්‍යාපාරික සේවා | 1.5 | -2.2 | -245.8 |
| **පුද්ගලික, සංස්කෘතික සහ විනෝදාත්මක සේවා** | **3.5** | **0.9** | **-75.0** |
| ශ්‍රව්‍ය දෘෂ්‍ය සහ ඊට අදාළ සේවා | 0.02 | -0.1 | -623.6 |
| වෙනත් පුද්ගලික, සංස්කෘතික සහ විනෝදාත්මක සේවා | 3.4 | 1.0 | -71.9 |
| **රජයේ භාණ්ඩ හා සේවා වියදම් (අන් තැනක සඳහන් නොවන)** | **0.1** | **0.04** | **-70.5** |

(අ) තාවකාලික

**මූලය:** අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය - ශ්‍රී ලංකා මහ බැංකුව